# නර්තනය

## 6 වන ශ්‍රේණිය

විස්තරාත්මක විෂය නිර්දේශය

(2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම.

<u>පටුන</u>


| | පිටුව |
|---|---|
| පොදු නිපුණතා | 1 |
| ශ්‍රේණියට අදාළ නිපුණතා | 2 |
| හැඳින්වීම | 3-4 |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද | 5 -6 |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 7 |
| තක්සේරුකරණය හා ඇගයීම | 8 |
| විෂය නිර්දේශය | 9 - 12 |


Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## පොදු නිපුණතා

1. නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

2. පරිසරය නිරීක්ෂණය කිරීමෙන් ලබන අත්දැකීම් ඇසුරුකොට නර්තන හා වාදන කලාකෘති නිර්මාණය කරයි.

3. නර්තනය හා බැඳි ඓතිහාසික සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

4. නර්තන කලා කෘතීන්ගේ සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳව විචාරාත්මකව කරුණු දක්වයි.

5. විවිධ කලා මාධ්‍යයන් නර්තනයේ දී අවස්ථාවෝචිත ව භාවිතයට ගනියි.

6. ප්‍රාසංගික කලා නිර්මාණ ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>6 ශ්‍රේණියට අදාළ නිපුණතා</u>

1. ශාරීරික නම්‍යතාවය සඳහා අවශ්‍ය සාම්ප්‍රදායික හා නිර්මාණාත්මක චලන ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි.

2. සාම්ප්‍රදායික නර්තන හා ගායන අංග ප්‍රදර්ශනය කරයි.

3. නර්තන හා වාදන අංග නිර්මාණය කරයි

4. තාල ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි.

5. දේශීය නර්තනය හා බැඳි පසුබිම අධ්‍යයනය කරයි.

6. ස්වාභාවික පරිසරයේ සෞන්දර්යාත්මක වටිනාකම අගය කරයි.

7. නර්තනය හා බැඳි කලා කෘති විචාරයට ලක් කරයි.

8. ප්‍රාසංගික කලා නිර්මාණ ප්‍රදර්ශනය කරයි.

9. ජීවිතයේ ඵලදායි ලෙස ගත කිරීම සඳහා සෞන්දර්යාවබෝධයෙන් කටයුතු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 6 ශ්‍රේණිය විෂය නිර්දේශය නර්තනය

## හැඳින්වීම

2006/2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව විෂයමාලා නවීකරණය කිරීම හා අධ්‍යාපන සංකල්ප යාවත්කාලීන කිරීම කාලීන අවශ්‍යතාවයක් බව පිළිගෙන ඇත. 2007 වසරේ සිට ක්‍රියාත්මකවන 6 ශ්‍රේණිය විෂය නිර්දේශය චිත්‍ර/නර්තන/සංගීතය නාට්‍ය හා රංග කලාව වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම විෂය නිර්දේශය නිපුණතා පාදකව සකස් වී ඇති අතර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමට සරිලන අයුරින් දැනුම, ආකල්ප, කුසලතා හා ජීවිතයට අදාළ කර ගැනීමට හැකි වන පරිදි සම්පාදනය වී ඇත.

විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයා වඩාත් ක්‍රියාකාරී ලෙස සහභාගි කරවා ගැනීම ගුරුවරයා සතු කාර්යභාරයකි. ඒ සඳහා යෝග්‍ය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගත යුතු වේ.

ප්‍රාථමික විෂයමාලාවක් හැදෑරීමෙන් පසු ද්විතීයික අධ්‍යාපනයට පිවිසෙන ශිෂ්‍යයාගේ ශාරීරික, මානසික හා චිත්තවේග වර්ධනයන් ශීඝ්‍ර ලෙස සිදුවන්නේ 6 වන ශ්‍රේණියට පිවිසීමත් සමඟය.

මෙම විෂය නිර්දේශයේ අපේක්ෂණය වන්නේ ශිෂ්‍යයාට නිදහසේ සතුටින් නර්තන කුසලතා ප්‍රදර්ශනයටත්, ගවේෂණයටත්, සන්නිවේදන කුසලතා දැක්වීමටත් තම ජීවිත ගැටළු නිරාකරණය කර ගනිමින් නව සහශ්‍රයට සරිලන පරිදි චින්තන කුසලතා වර්ධනය කර ගැනීමත්ය. ඒ සඳහා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී ගුරු - ශිෂ්‍ය කාර්යභාරය පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව පහත සඳහන් අංග කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගත යුතු වේ.

- නර්තනය හා බැඳි ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා සිද්ධාන්ත.
- නර්තනය හා බැඳි සංස්කෘතික හා ඓතිහාසික පසුබිම.
- නිර්මාණ ඉදිරිපත් කිරීමේ කුසලතාව.
- රසාස්වාදය.
- සෞන්දර්ය විෂය හා බැඳි වටිනාකම්

ඉහත ක්ෂේත්‍ර කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමින් ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට අවශ්‍ය නර්තන ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම ඔබගේ වගකීම හා කාර්යභාරය වනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

විෂය නිර්දේශයේ සැකැස්ම දල වශයෙන් කොටස් කීපයකට බෙදා දක්වා ඇත.

- නිපුණතාවය
- නිපුණතා මට්ටම
- විෂය අන්තර්ගතය හා කාලය
- ගුණාත්මක යෙදුම් භාවිතය
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම උපායන්
- පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය
- තක්සේරු කරණය හා ඇගයීම වශයෙනි.

විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මහපෙන්වීම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇත. එහි අන්තර්ගතය නිපුණතා 5 ක් හා නිපුණතා මට්ටම් 21 ක් අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරයකු වශයෙන් ඔබගේ වෘත්තීය සාඩම්බර අයුරින් ආත්ම විශ්වාසයෙන් යුතු ව ධෛර්ය සම්පන්න ව ඉටු කරන්නේ නම් යහපත් සෞන්දර්ය රසඥතාවයෙන් යුත් ශිෂ්‍ය පරපුරක් බිහිකිරීමේ ගෞරවය ඔබට හිමිවනු ඇතැයි විශ්වාස කරමු.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# <u>ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය</u>

6 වන ශ්‍රේණියේ දී නර්තන විෂය හදාරණ ශිෂ්‍යයා අපේක්ෂිත සාධන මට්ටම කරා ළඟාකරවීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකළ යුතු වන්නේ ය. ඒ සඳහා සුවිශේෂ වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම විෂය භාර ගුරුවරයාගේ කාර්ය භාරය වේ.

1997 වසරේ සිට ක්‍රියාත්මක මෙම නව විෂය නිර්දේශය නිපුණතා පාදක සංකල්පය මත ගොඩනැගී ඇති බැවින් ඊට සරිලන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලින්ද සැලසුම් කරගත යුතු ය. ඒ අනුව ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලින් භාවිත කිරීම වඩාත් ඵලදායි වනු ඇත. විශේෂයෙන් නර්තනය ප්‍රායෝගික විෂයක් වන හෙයින් එම විෂය හදාරණ සිසුන් මාර්ග දෙකක් ඔස්සේ අධ්‍යයනයට යොමු කළ යුතු වේ. ඉන් එක් මඟක් වනුයේ ප්‍රායෝගික කුසලතා පිළිබඳ නිපුණතාවය කරා සිසුන් ළඟාකරවීමය. අනෙක ඒ හා සම්බන්ධ සිද්ධාන්තමය හා සංස්කෘතික පසුබිම පිළිබඳව දැනුම හා ආකල්ප වර්ධනය කරලීම සඳහා මඟ සලසා දීමය.

ඒ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලින් අනුගමනය කිරීමේදී පළමු පියවරක් වශයෙන් සිසුන්ගේ අවධානය දිනා ගැනීම අත්‍යවශ්‍ය වේ. මීට අමතර වශයෙන් පෙර දැනුම සිහිපත් කිරීමටත් ඉදිරි කටයුතු පිළිබඳ අවදියක් ඇතිකිරීමටත් පියවර ගත යුතු ය.

විෂයයට අදාළ තොරතුරු අධ්‍යයනයේදී සිසුන් නිරීක්ෂණයට හා ගවේශණයට යොමුකරවීම වැදගත් වේ. මෙම කාර්යයේදී සිසුන් තනිව හා කණ්ඩායම් වශයෙන් යෙදවීම ද ප්‍රයෝජනවත් වේ. මක්නිසා ද යත් සමාජ සම්බන්ධතා හා හැකියා සිසුන් තුල වර්ධනය කරලීමට එමඟින් හැකියාව ලැබෙන බැවිනි.

නිරීක්ෂණ හා ගවේෂණ ඇසුරින් සිසුන් අනාවරණය කරගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම ප්‍රයෝජනවත් වනු ඇත. අදහස් ඉදිරිපත් කිරීමේදී පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට ද දෙවනුව සවන් දුන් කණ්ඩායම් ද තෙවනුව ගුරුවරුන් ද එම තොරතුරු ඇසුරින් සාකච්ඡා මෙහෙයවීම වැදගත් වේ.

මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ක්‍රම ශිල්ප රාශියක් භාවිත කළ හැකි වේ. මෙහිදී ප්‍රවේශයක් වශයෙන්

බුද්ධි කලම්බන
සංවාද
පින්තූර ඇසුරින් කරුණු සකච්ඡා කිරීම
කණ්ඩායම් සාකච්ඡා
නිර්මාණ ක්‍රියාකාරකම්
ආදර්ශන (නර්තන, ගායන, වාදන)
ක්ෂේත්‍ර අධ්‍යයන

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ප්‍රදර්ශන, ආදිය භාවිත කළ හැකි ය.

ප්‍රායෝගික කුසලතා වර්ධනය අරමුණින් කෙරෙන ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලියේදී නර්තනය සඳහා සුවිශේෂ වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප භාවිත කළ හැකිය.

අනුකරණ ක්‍රමය

අභ්‍යාස ක්‍රමය

පියවර ක්‍රමය

කණ්ඩායම් ක්‍රමය

කැඩපත් ක්‍රමය

සිද්ධි රංගන

රංග ක්‍රීඩා

භූමිකා රංගන, වැනි ක්‍රම ශිල්ප යොදා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත. මීට අමතරව ගුරුවරයාම සුදුසුයයි සිතන වෙනත් ක්‍රම ශිල්ප භාවිත කළ හැකිය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>පාසල් ප්‍රතිපත්ති හා පාසල් වැඩසටහන්</u>

නර්තන විෂය නිර්දේශය පාසල තුළ ක්‍රියාත්මක වීමේදී නිපුණතා පාදක ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන අවස්ථා උදාකරදීමට සැලසුම් කොට ඇත. එහිදී නිර්දේශිත විෂයමාලාවට අමතරව පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබන විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යාගේ සහභාගීත්වය, අපේක්ෂිත නර්තන විෂය නිපුණතා සාක්ෂාත් කරගැනීමට මහත් පිටුවහලක් වනු ඇත. මෙහිදී , ප්‍රදර්ශන, සංදර්ශන, ව්‍යාපෘති , කලා සංගම්, පුස්තකාල පරිහරණය වැනි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම අවධාරණය කෙරේ.

නර්තන නිර්මාණකරණයේදී පරිසර නිරීක්ෂණය අත්‍යවශ්‍ය සාධකයක් වේ. පරිසරයේ විවිධ සංසිද්ධීන් කෙරෙහි ශිෂ්‍යයා සංවේදී පුද්ගයකු කිරීමට නිරීක්ෂණ චාරිකා, කලා නිර්මාණ හා කලා මධ්‍යස්ථාන අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම ඉතා වැදගත් වේ. මීට අමතරව බිත්ති පුවත්පත් , චාර සඟරා, තරග වැනි ක්‍රියාකාරකම් සිසුන්ගේ නිර්මාණාත්මක ශක්ති වර්ධනය කෙරෙහි බලපාන සැඟවුන විෂයමාලාවට අයත් අංග ලෙස සැළකිය හැකිය.

මිනිස් චර්යා හැඩගැස්වීම කෙරෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් කරනු ලබන බලපෑම අතිවිශාල වේ. රසඥතා වර්ධනය සහ විචාර ශක්ති වර්ධනය සඳහා මාධ්‍ය වැඩසටහන් අධ්‍යයනය කිරීම වැදගත් වන අතර, ඒ සඳහා ශිෂ්‍යයනට අවශ්‍ය පහසුකම් සලසාදීම පිළිබඳ ව පාසල් බලධාරීන්ගේ අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත.

උක්ත ක්‍රියාකාරකම් හා නර්තන විෂය සන්ධාරය අතර ඇති සහසම්බන්ධතාව, නර්තන විෂය හැදෑරීමේදී ශිෂ්‍යයාට පාසල් පරිසරය ප්‍රිය ජනක ඉගෙනුම් අත්දැකීම් ඇති ස්ථානයක් බවට පත්කිරීමට සමත්වනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>තක්සේරුව හා ඇගයීම</u>

ඉගෙනුම හා ඉගැන්වීම යන කාර්යයෙහි ප්‍රමාණාත්මකවූද ගුණාත්මක වූ ද වර්ධනයක් ඇතිකරලීම සඳහා යොදාගත හැකි ප්‍රධානතම සාධකය ඇගයීමයි. නූතන අධ්‍යාපන ව්‍යවහාරය "ඇගයීම" යන්න තක්සේරුව හා ඇගයීම වශයෙන් දෙආකාර වේ.

මෙහිදී සිසුන්ගේ ඉගෙනීමේ සාඵල්‍යයේ විවිධතා හඳුනාගැනීම සහ සාධනය ඉහල නැංවීම සඳහා පන්තිකාමරයේ නිරන්තරයෙන් සිදුකරන ලද ක්‍රියාවලිය තක්සේරුවයි. ඇගයීම යනු තක්සේරුකරණයෙන් ශිෂ්‍යයා කවර ප්‍රාප්ති මට්ටමකට එළඹ සිටීදැයි නිශ්චිත වශයෙන්ම සොයා බැලීමයි. මෙකී ක්‍රියාවලිය විෂය නිර්දේශයේ නිර්දේශිත විෂය කරුණුවලට අනුව ගුරුවරයාගේ අභිමතය පරිදි සිදු කළ හැක.

පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ සකස් කරන ලද ඇගයීම් උපකරණ ආදිය පිළිබඳ ව සවිස්තරාත්මක කරුණු ගුරු මාර්ගෝපදේශක සංග්‍රහයේ දැක්වේ. මෙහි ඇතුළත් ආකෘති නිපුණතා හා නිපුණතා මට්ටම්වලට අනුව උචිත ලෙස සකසා සිසුන් තක්සේරු කිරීමේ කාර්යයේදී භාවිත කළ හැකි ය.

ක්‍රියාකාරකම්වලදී සෑම ශිෂ්‍යයකුටම සමාන ඉගෙනුම් අවස්ථා සලසාදීම වැදගත් අංගයක් වන අතර ශිෂ්‍ය සක්‍යතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ කාර්ය සැලසුම් කරගැනීම පන්තිකාමර ඉගෙනුම් ක්‍රියාවලියේ විශේෂ අංගයක් වනු ඇත.

නර්තන විෂය හුදෙක් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් යුතු විෂයක් වන හෙයින් පන්ති කාමරයේ සිදුවන තක්සේරුකරණය ශිෂ්‍යයාගේ ප්‍රායෝගික කුසලතා මෙන්ම එහි ප්‍රගතිය තක්සේරු කිරීමට මහඟු අවස්ථාවක් වනු ඇත.

සිසුන් ඉගෙනීමෙහි යෙදෙනවිට කරනු ලබන ඉහත කී තක්සේරුවට අමතරව වර්ෂය තුළ නිශ්චිතවම සිදුකළ යුතු ඇගයීම් වාර අවස්ථා හයක් ද වේ. තෝරාගත් අවස්ථා (ලක්ෂ) හයකදී මෙම ඇගයීම් ක්‍රියාත්මක කිරීම ඉතා ඵලදායි වනු ඇත. ඒ සඳහා ගැළපෙන ඇගයීම් උපකරණ කල්තබා සකස්කරගෙන සිටීම වැදගත් වේ.

මෙම ඇගයීම් ක්‍රියාවලියේදී ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම් පිළිබඳ විශේෂයෙන් අවධාරණය කෙරෙන හෙයින් ප්‍රවීණතාව තහවුරු කිරීමට අවම වශයෙන් ලකුණු 60 ක්වත් ලබාගැනීම අවශ්‍ය වේ. ලකුණු 60-80 දක්වා සීමාව ආසන්න ප්‍රවීණතා මට්ටම ලෙසත්, ලකුණු 60 ට අඩු සීමාව ප්‍රවීණතාව ලබා නොමැති ලෙසත් සළකනු ලැබේ.
මෙකී කරුණු පහත සඳහන් අයුරින් වර්ගගත කළ හැකි ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඒ අනුව | ලකුණු | 0 | - | 60 | - | ප්‍රවීණතාව ලබා නොමැත. |
| | ලකුණු | 61 | - | 80 | - | ආසන්න ප්‍රවීණතාවට ළඟා වී ඇත. |
| | ලකුණු | 81 | - | 100 | - | ප්‍රවීණතාව ලබා ඇත. ආදි වශයෙන් සැලකිය යුතු වේ. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6 ශ්‍රේණිය - නර්තනය විෂය නිර්දේශය

| නිපුණතාව හා නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 1 නිපුණතාව<br>නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>නිපුණතා මට්ටම | | |
| 1.1 ශාරීරික නාම්‍යතාවය සඳහා අවශ්‍ය චලන ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | නිර්මාණී නැටුම්<br>• ස්ථිතික චලන<br>• සංචාරී චලන | 07 |
| 1.2 පාද හුරුකර ගැනීම සඳහා මූලික සරඹ අභ්‍යාස කරයි. | නමස්කාර පදය<br>උඩරට හමාර පදය සමඟ පා සරඹ<br>1 - 2 දක්වා<br><br>පහතරට හමාර පදය සමඟ පා සරඹ<br>1 - 2 දක්වා<br><br>සබරගමු හමාර පදය සමඟ - දොඹින පද<br>1 - 2 දක්වා | 05 |
| 1.3 නර්තන ක්‍රියාවලිය හා සිරුර අතර ඇති සහසම්බන්ධතාවය අධ්‍යයනය කරයි. | මූලික අංගහාර | 01 |
| 1.4 නිවැරදි අංගහාර පවත්වා ගනිමින් නර්තනාංග ඉදිරිපත් කරයි. | උඩරට කස්තිරම සමඟ - ගොඩ සරඹ 1 - 2 දක්වා<br>පහතරට කෙටි ඉරට්ටිය සමඟ - ඉලංගම් සරඹ 1 - 2 දක්වා<br>සබරගමු කලාසමක් සමඟ - පිට මාත්‍රා පද - (ජිමිත කුඳාදොං මාත්‍රයේ පද 2 ක් ) | 06 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 1.5 තාල ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | මාත්‍රා 2 තනිතිතේ තාලය<br>මාත්‍රා 3 තනිතිතේ තාලය<br>මාත්‍රා 4 තනිතිතේ තාලය<br>බෙර පද, රබන් පද කවි ඇසුරෙන් | 04 |
| 1.6 ගැමි ගායනා ඉදිරිපත් කරයි. | | 08 |
| 1.7 සාම්ප්‍රදායික නර්තනය හා බැඳි ගායන ඉදිරිපත් කරයි. | ලි කෙළි කවි<br>කළ ගෙඩි කවි<br>නැළවිලි කවි<br>මේවර කවි | 02 |
| 1.8 ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | උඩරට - හනුමා වන්නම<br>පහතරට - සරළ කවි තාලයක්<br>සබරගමු - අනිලා වන්නම | 05 |
| 1.9 වාදනයේ මූලික හැකියා ප්‍රදර්ශනය කරයි. | උඩරට කෙටි කස්තිරමක් සමග හනුමා වන්නම<br>පහතරට කෙටි ඉරට්ටිය සමග- මාත්‍ර 2 තනිතිතේ තාලයට සරල කවි තාලයක්<br>සබරගමු කෙටි කලාසමක් සමග - අනිලා වන්නම | 04 |
| 2 නිපුණතාව<br>පරිසරය නිරීක්ෂණය කිරීමෙන් ලබන අත්දැකීම් ඇසුරුකොට නර්තන හා වාදන කලාකෘති නිර්මාණය කරයි. | මාත්‍රා 2,3,4, තාලරූප අනුව රබන්පද වාදනය | |
| නිපුණතා මට්ටම<br>2.1 විවිධ චරිත සඳහා නර්තන නිර්මාණ කරයි. | සත්ව චරිත නිර්මාණ<br>මිනිස් චරිත නිර්මාණ | 06 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| | - ප්‍රකාශනය, තාලය, රිද්මය<br>- උචිත සංචලන<br>- නිර්මාණාත්මක බව | |
| 2.2 ගැමි ක්‍රීඩා සඳහා නර්තන නිර්මාණ කරයි. | මේවර කෙළිය | 04 |
| 2.3 ගැමි නැටුම් නිර්මාණ කරයි | ලී කෙළි නැටුම ,කළගෙඩි නැටුම උචිතපද,අවකාශ භාවිතය,සම්බන්ධතා හා රංග රටා | 09 |
| 2.4 සමූහ වාදන නිර්මාණ කරයි | සම්ප්‍රදායික හා ආදේශ භාණ්ඩ ඇසුරින් වැස්ස. | 08 |
| 3. නිපුණතාව<br><br>නර්තනය හා බැඳි ඓතිහාසික සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br><br>නිපුණතා මට්ටම | | |
| 3.1 සමාජයීය, සංස්කෘතික උත්සව හා බැඳි නර්තන, ගායන,වාදන පිළිබඳ අදහස් දක්වයි. | සිංහල හා හින්දු අවුරුදු උත්සවය නර්තන,ගායන, වාදන, සැරසිලි, රංග වස්ත්‍රාභරණ, චාරිත්‍ර විධි | 02 |
| 3.2 ආගමික උත්සව හා බැඳි නර්තන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | වෙසක් උත්සවය<br>පොසොන් උත්සවය<br>නර්තන, ගායන,වාදන,<br>රංගවස්ත්‍රාභරණ, සැරසිලි | 03 |
| 3.3 දේශීය නර්තන සම්ප්‍රදායන්ගේ සංස්කෘතික පසුබිම විස්තර කරයි. | ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය උඩරට/පහතරට/සබරගමු<br>ප්‍රචලිත ප්‍රදේශ,<br>ප්‍රධාන ශාන්තිකර්ම හා පැවැත්වීමේ හේතු<br>ප්‍රධාන වාද්‍ය භාණ්ඩය,<br>රංගවස්ත්‍රාභරණ | 02 |
| 3.4 නර්තනය පිළිබඳ තොරතුරු ඇතුලත් ක්ෂේත්‍ර | ළමා නර්තන | 06 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| පොතක් සකස් කරයි. | සම්ප්‍රදායික නර්තන<br>ප්‍රවීණ නර්තන ශිල්පීන්<br>වෙනත් සංස්කෘතීන්ට අයත් නර්තන | |
| 4 නිපුණතාව<br>නර්තන කලාකෘතීන්ගේ සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳව විචාරාත්මකව කරුණු දක්වයි.<br><br>නිපුණතා මට්ටම | | |
| 4.1 ස්වභාවික පරිසරයේ දක්නට ලැබෙන සෞන්දර්යාත්මක වටිනාකම් අගය කරයි. | ගංගා, ඇලදොල, වාක්ෂලතා ආදියේ හැඩතල, රිද්ම රටා, වර්ණ | 03 |
| 4.2 පාසලේ දක්නට ලැබෙන නර්තන කලාකෘති අගය කරයි. | විවිධප්‍රසංග හා උත්සව අවස්ථාවල දක්නට ලැබෙන නර්තනයන්හි<br>නර්තන<br>ගායනා<br>වාදන<br>රංග වස්ත්‍රාභරණ හා සැරසිලි | 03 |
| 4.3 ප්‍රදේශයේ දක්නට ලැබෙන නර්තන කලාකෘති අගය කරයි.<br><br><br><br>5 නිපුණතාව<br>ප්‍රාසංගික කලා නිර්මාණ ප්‍රදර්ශනය කරයි.<br><br>නිපුණතා මට්ටම | පෙරහැරෙහි දක්නට ලැබෙන<br>නර්තන<br>ගායනා<br>වාදන<br>රංග වස්ත්‍රාභරණ<br>සැරසිලි | 03 |
| 5.1 විවිධ ප්‍රසංග ඉදිරිපත් කරයි. | පාසලේ ඉගෙන ගන්නා ලද<br>නර්තන<br>ගායන<br>වාදන | 09 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.